චක්‍රලේඛ අංක: 04/2013

RG/MBD/1/124

1 E DEC 2015

FPM | LND
MAG | ESD
LED | RE
SDV |

2013/02/8

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ප්‍රාදේශීය ලේකම්

.............................

**ආදිවාසීන්ගේ ජනතාවගේ විවාහ ලියාපදිංචි කිරීම**

112 අධිකාරය වන සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ පනත යටතේ වන විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් ආදිවාසී ජනතාව නිදහස් කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක FP/06/60/01/01 සහ 2013/01/31 දිනැති ලිපියෙන් මා වෙත උපදෙස් ලැබී ඇත.

02. ඒ අනුව 2012/12/26 දිනැති අංක 5/2012 දරණ චක්‍රලේඛයේ සඳහන් සියළුම ගාස්තුවකින් නිදහස්ව ආදිවාසීන්ගේ විවාහ සම්ප්‍රදායෙන් නොමිලේ ලියාපදිංචි කිරීමට ඔබගේ බල ප්‍රදේශයේ සේවයේ නියුතු විවාහ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට කාරුණිකව කටයුතු කරන්න.

03. මෙහිදී ආදිවාසීන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරී වාර්තාවක් පමණක් උපයෝගී කර ගැනීම මැනවි. මේ සම්බන්ධයෙන් අදාල ග්‍රාම නිලධාරීවරුන් දැනුවත් කිරීමටද කාරුණික වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්
වී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

01. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - ඔබේ අංක FP/06/60/01/01 අනුවදැ.ගැ.ස.

02. ලේකම්/රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

03. දිස්ත්‍රික් ලේකම් /අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් බදුල්ල/මඩකලපුව/අම්පාර/මොණරාගල - කා.දැ.ගැ.ස.

04. ඌව සබරගමුව හා නැගෙනහිර කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කලාපයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට

05. ඩී.එන්.ඩී. මුණසිංහ මයා, පරිපාලන නිලධාරී, ආදිවාසී ජන උරුම කේන්ද්‍රය, දඹාන - අ.ක.ස.